# සත්‍ය ආගම

කතෘ:

අබූ අමීනාහ් බිලාල් පිලිප්ස්

පරිවර්තනය:

එස්. ඇම්. මන්සූර්

කැඳවීමේ හා මඟපෙන්වීමේ සහයෝගී කාර්යාලය
අල් බදීයා - සමාජ ඒකකය
රියාද්, සවූදි අරාබියාව.

1/1420 H

35

COOPERATIVE OFFICE FOR CALL AND GUIDANCE

ඉස්ලාම් පර්යේෂණ නිර්ණ හා ප්‍රචාරක

අධිකාරයේ

අධීක්ෂණය යටතේ පාලනයවෙන

කැඳවුම් හා මග දැක්වුම් සහයෝගිතා
කාර්යාලය


තැ: පෙ: 20824 රියාද්
දුරකථන අංකය: 4030251, 4034517,
4031587,

ෆැක්ස් - 4059387



මෙම ග්‍රන්ථය පූර්ව ලිඛිත අවසරයෙන් තොරව,
මුද්‍රණය හෝ පිටපත් කිරීම මෙම කාර්යාලය
මගින් සම්පූර්ණයෙන් තහනම් කර ඇත.

# සත්‍ය ආගම

කතෘ:
අබූ අමීනාහ් බිලාල් පිලිප්ස්

පරිවර්තකය:
එස්. ඇම්. මන්සූර්

කැඳවීමේ හා මඟපෙන්වීමේ සහයෝගී කාර්යාලය
අල් බදීයා - සමාජ ඒකකය
රියාද්. සවූදි අරාබියාව.

# ඉස්ලාම් ආගම

ඉස්ලාම් යනු, අරාබි වචනයකි. එහි තේරුම කුමක්ද යන්න දැනගැනීම හැම කෙනෙකුටම ඉතාමත් වැදගත් කරුණක් වන්නේය.

මෙලෝ ඇත්තාවූ ආගම් සියල්ල යම්කිසි පුද්ගලයෙකුගේ
නාමයෙන් හෝ යම්කිසි සමාජයක නාමයෙන් හෝ ව්‍යවහාර වන බව පැහැදිලිවම පෙනෙන්නට ඇත. ක්‍රිස්තියානි ආගම ක්‍රිස්තුස් වහන්සේගේ නමින්ද, බුද්ධාගම ගෞතම බුදුන් වහන්සේගේ නමින්ද, කොන්පියුෂියස් ආගම කොන්පියුෂියස් තුමාගේ නමින්ද, මාර්ක්ස්වාදය කාර්ල් මාක්ස්ගේ නමින්ද ව්‍යවහාර වේ. එමෙන්ම යුදෙව් ආගම යුදියා රටේ යුද ගෝත්‍රයේ උපත ලත්නිසා යුදෙව් ආගම යනුවෙනුත්, හින්දු ආගම ඉන්දියාවේ හින්දු සමාජයේ උපත ලත්නිසා හින්දු ආගම යනුවෙනුත් හඳුන්වනු ලැබේ.

නමුත් ඉස්ලාම් ආගම කිසිම පුද්ගලයෙකුගේ නමින් හෝ කිසිම රටක, සමාජයක නමින් හෝ ව්‍යවහාර නොවෙයි. ඉස්ලාම් වනාහි විශ්වයාධිපති අල්ලාහ් විසින් මිනිසා වෙත පිරිනමනු ලැබූ සත්‍ය වූ ආගමක් ය. එහි අරමුණ නම් මුළු මිනිස් වර්ගයාම අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම අවනත වීමය.

ඉස්ලාම් යනු අරාබි වචනයේ අවනත වීම, යටහත් වීම, කීකරු වීම යනාදී අරුත් ගැබ්වී ඇත. මේ අනුව යමෙකු අල්ලාහ්ට මුළුමනින්ම අවනත වී, ඔහුට පමණක් වැඳුම් පිදුම්කර ඔහු අණකළ පරිදි ජීවත්වන්නේ නම් එම තැනැත්තා මුස්ලිමෙකි. ඉස්ලාම් යනු වචනයෙහි සාමය නම් අර්ථයද ගැබ්වී ඇත. මෙයින් තේරුම් කරගතයුත්තේ, යමෙකු අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනතවී ජීවත්වීමෙන් ලැබෙන ස්වාභාවික ප්‍රතිඵලය නම් ඔහු තරා සාමය ලඟාවීම යන්නය.

ඉස්ලාමය සත්වෙනි ශතවර්ෂයේ අරාබිකරයේ ජීවත්වූ මුහම්මද් (සල්)* නබිතුමා විසින් ගෙනඑනු ලැබූ අළුත් ආගමක් නොව එතුමාගේ මාර්ගයෙන් අන්තිමවරට දෙනු ලැබුවකි. ඇත්ත වශයෙන් ම ඉස්ලාමය අල්ලාහ් විසින් ප්‍රථමයෙන්ම දෙනු ලැබුවේ ලොව උපත ලැබූ ප්‍රථම මිනිසා හා අල්ලාහ්ගේ පළමුවන නබිවරයා වන ආදම් (අලෙයි)** තුමාටය. එතුමාගෙන් ආරම්භවූ මිනිස් වර්ගයා වෙත අල්ලාහ් විසින් එවනු ලැබූ සෑම නබිවරයෙකුගේම ආගම වූයේද ඉස්ලාමය.

අල්ලාහ් විසින් පිරිනමනු ලැබූ මෙම ආගමට ඉස්ලාම් යනු නම තැබුවේ මිනිසුන් විසින් නොවේ. එම නම අල්ලාහ් විසින්ම තබන ලදී. මේ ගැන ශුද්ධ කුර්ආනය ඉතාමත් පැහැදිලිව පවසන්නේය.

---

* සල් - (සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම්)

** අලෙයි - (අලෙයි හිස්සලාම්)

කුර්ආනය මෙසේ කියයි:

﴿ ٱلْيَوْمَ أَكْمَلْتُ لَكُمْ دِينَكُمْ وَأَتْمَمْتُ عَلَيْكُمْ نِعْمَتِى وَرَضِيتُ
لَكُمُ ٱلْإِسْلَٰمَ دِينًا ﴾

***අද දින ඔබවෙනුවෙන් ඔබගේ ආගම සම්පූර්ණ කර ඇත්තෙමි. තවද, මාගේ ප්‍රසාදයන් ද සම්පූර්ණ කර ඇත්තෙමි. එමෙන්ම, ඔබ වෙනුවෙන් වූ ආගම ලෙස ඉස්ලාමය තෝරාගෙන ඇත්තෙමි.***

( අල් කුර්ආන් 5:3)

﴿ وَمَن يَبْتَغِ غَيْرَ ٱلْإِسْلَٰمِ دِينًا فَلَن يُقْبَلَ مِنْهُ ﴾

***තවද, ඉස්ලාම් නොවන (හැර) වෙන ආගමක් යමෙකු විසින් ආශාකරන්නේ නම් එය කිසිසේත් පිළිගනු නොලැබේ***

(අල් කුර්ආන් 3:85)

﴿ مَا كَانَ إِبْرَٰهِيمُ يَهُودِيًّا وَلَا نَصْرَانِيًّا وَلَٰكِن كَانَ حَنِيفًا مُّسْلِمًا ﴾

***ඉබ්‍රාහිම් (ඒබ්‍රහම්) යුදෙව්වෙකු හෝ ක්‍රිස්තියානි යෙකු හෝ නොවෙයි. හෙතෙම අවංක මුස්ලිමෙකු වේ.***

(අල් කුර්ආනය 3:67)

මූසා (මෝසස්) නබිතුමාණන්ගේ අනුගාමිකයින් හෝ ඔවුන්ගෙන් පැවත එන්නන් අමතා 'ඔබ සැමගේ ආගම යුදෙව් ආගමය' යනුවෙන් අල්ලාහ් ප්‍රකාශකළ බව බයිබලයේ කොතැනකවත් සඳහන් වී නැත. එමෙන්ම, ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන්ට ද ඔවුන්ගේ ආගම ක්‍රිස්තියානි ආගම යැයි ප්‍රකාශ කර නැත.

අපි දැනගත යුතු වැදගත් කාරණයක් ඇත. එනම්, 'ක්‍රයිස්ට්' හා 'ජීසස්' යනු නාම යන් යේසුස් වහන්සේගේ නාමයන් ද? ඇත්ත වශයෙන් ම එසේ නැත. මේවා එතුමාගේ නාමයන් නොවේ. 'ක්‍රයිස්ට්' නම 'ක්‍රිස්ටෝස්' නම් වූ ග්‍රීක වචනයකින් උපත ලැබූවකි. 'ක්‍රිස්ටෝස්' යනු අභිෂේක කරනු ලැබූ නම් අරුතවෙයි. 'ක්‍රයිස්ට්' යනු 'මෙසයියාහ්' නම් වූ හීබෲ නාමෙහි ග්‍රීක අනුවාදය වේ. තවද, 'ජීසස්' යනු 'ඊසා' නම් වූ හීබෲ නාමෙ ලතින් පරිවර්තනය වේ.

මෙසේ කරුණු ඇතත්, පහසුව තකා මෙම පොත් පිංචයෙහි ඊසා නබිතුමාගේ නම 'යේසුස්' යනුවෙන් ම මා භාවිතා කරමි.

ලොව පහළවූ අනෙක් නබිවරුන් මෙන්ම, යේසුස් නබිතුමාණෝත් තමන්ගේ අනුගාමිකයන්හට දේශනය කළේ අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම අවනතවන ලෙසය. තවද, මිනිසා තමාගේ සිතින් මවාගත්තා ව්‍යාජ දේව

විශ්වාසයන්ගෙන් ද ඈත්වී සිටින ලෙස එතුමා තම අනුගාමිකයන්හට අවවාද කළහ; මෙය ඉස්ලාමය.

බයිබලයේ අළුත් ගිවිසුම අනුව, 'ස්වර්ගයේ මෙන් මෙලොවෙහිදීත් ඔබගේ අණය ඉටුවේවා.' යනුවෙන් ප්‍රාර්ථනා කරන ලෙසය, එතුමා තම අනුගාමිකයන්ට ඉගැන්වූයේ.

## ඉස්ලාමයේ පණිවිඩය

අල්ලාහ්ගේ දිව්‍යමය ආගම වූ ඉස්ලාමයේ මූලික පණිවිඩය වන්නේ මුළු මිනිස් සංහතියම ඔහුට සම්පූර්ණයෙන්ම අවනතවිය යුතු බවය ; ඔහුගේ අණට කීකරු විය යුතු බවය; ඔහු ගෙන දක්වා ඇති අවවාද අනුශාසනා පිළිපදිමින් පිවත් විය යුතු බවය.

මිනිසා අල්ලාහ්ට හැර වෙන යම්කිසි පුද්ගලයෙකුට, පිළිමයකට, ගින්නට, ස්ථානයකට හෝ වෙන මොනම දෙයකටවත් වැඳුම් පිදුම් කිරීමෙන් වැළකී සිටීම ඉස්ලාම් නම් වේ.

මෙලොව ඇති සෑමයක්ම මවන ලද්දේ අල්ලාහ් විසින්ය. එමනිසා ඉස්ලාමය කියා සිටින්නේ මැවීම්වලට වැඳුම් පිදුම් නොකර මැවුම්කාරයා වූ අල්ලාහ්ට එසේ කරන ලෙසය. මිනිසාගේ වැඳුම් පිදුම් ලැබීමට එකම සුදුස්සා අල්ලාහ් පමණය; එමෙන්ම මිනිසාගේ ප්‍රාර්ථනාවන්ට පිළිතුරු දෙන්නේද ,

අල්ලාහ් පමණය. යම් කෙනෙකු ගසකට ප්‍රාර්ථනාකර එම ප්‍රාර්ථනාවට පිළිතුරක් ලැබුනේ නම්, එම පිළිතුර ගසෙන් නොව, එවැනි පිළිතුරක් ලැබීමෙහිලා අල්ලාහ්ගේ නියමයක්, අවස්ථාවක් තිබී ඇත. ඒ අනුව එම පිළිතුර ලැබී ඇත යන්නය සත්‍යය වන්නේ. සමහරෙකු කියන්න පුළුවනි එය එසේ නොවන බව. ගසකට වැඳුම් පිදුම් කිරීමෙහි කිසිම සත්‍යතාවයක් නැත.

එපමණක් නොව, යේසුස් තුමා, බුදුන් වහන්සේ, ක්‍රිෂ්ණා, ශාන්ත ක්‍රිස්ටොපර් තුමා, ශාන්ත ජූඩ්තුමා පමණක් නොව මුහම්මද් (සල්)* නබිතුමාට පවා ප්‍රාර්ථනා කිරීමෙහිලා පිළිතුරු ලබා නොගනිමු. ප්‍රාර්ථනාවන්ට පිළිතුරු දෙනු ලබන්නේ අල්ලාහ් විසින් පමණය. ජේසුස් වහන්සේ තම අනුගාමිකයන්ට දේශනාකළේද අල්ලාහ් හැර තමන් වෙත ප්‍රාර්ථනාවන් නොකළ යුතු බවය.

කුර්ආනය මෙසේ සඳහන් කරයි.

﴿ وَإِذْ قَالَ ٱللَّهُ يَٰعِيسَى ٱبْنَ مَرْيَمَ ءَأَنتَ قُلْتَ لِلنَّاسِ ٱتَّخِذُونِى وَأُمِّىَ إِلَٰهَيْنِ مِن دُونِ ٱللَّهِ ۖ قَالَ سُبْحَٰنَكَ مَا يَكُونُ لِىٓ أَنْ أَقُولَ مَا لَيْسَ لِى بِحَقٍّ ﴾

***තවද. අල්ලාහ් අසන්නේය: "මරියම්ගේ පුත් ජේසුස් ! "අල්ලාහ් හැර මා හා මගේ මවට වැඳුම් පිදුම් කරන්න" යනු ඔබ මිනිසුන්හට දේශනය කළේද?" (යනුවෙන්). එවිට ඔහු (ජේසුස්) "ඔබ ඉතාමත් ශ්‍රේෂ්ඨ වන්නය මා හට අයිතියක් නැති දේ ගැන මා (කිසිවක්) කීමට බැරිය. (යනු කියයි.)"***

(අල්කුර්ආන් 5:116)

---

* සල් - (සල්ලල්ලාහු අලෛයිහිවසල්ලම්)

යේසුස් තුමා තමන්ට තමන්ම වැඳුම් පිදුම් කරගත්තේ ද නැත. එතුමාද සම්පූර්ණයෙන්ම අවනත වූයෙත්,වැඳුම් පිදුම් කළේත් අල්ලාහ්ටමය. කුර්ආනයේ "සූරතුල් පාතිහා" නම් පරිච්ඡේදයේ සතරවෙනි වාක්‍යයෙහි මෙම මූලික අදහස ගැබ්වී ඇත.

﴿ إِيَّاكَ نَعْبُدُ وَإِيَّاكَ نَسْتَعِينُ ﴾

***"ඔබට පමණක් අපි ඉබාදත් (වැඳුම් පිදුම්) කරමු: ඔබෙන් පමණක් පිහිට පතමු."***

ශුද්ධ කුර්ආනයේ තවත් තැනක අල්ලාහ් මෙසේ පවසයි:

﴿ وَقَالَ رَبُّكُمُ ادْعُونِي أَسْتَجِبْ لَكُمْ ﴾

***"ඔබේ අධිපතියා පවසයි: ඔබ මාවෙත ප්‍රාර්ථනා කරන්න: මම ඔබ (ප්‍රාර්ථනාවන්) ට පිළිතුරු දෙමි."***

(අල්කුර්ආන් 40:60)

ඉස්ලාමයේ මූලික පණිවිඩයේ අඩංගු වැදගත් අදහසක් නම්, අල්ලාහ්ටත් ඔහුගේ මැවීම්වලටත් අතර අති විශාල වෙනසක් ඇති බවය. අල්ලාහ් ඔහුගේම මැවීමක් හෝ එහි කොටසක් නොවන්නා සේම, ඔහු විසින් මවන ලද අනෙකුත් දේ ද ඔහු හෝ ඔහුගෙන් කොටසක් නොවන්නේ ය.

මෙය පැහැදිලිවම පෙනෙන්නට ඇතත්, මැදුම්කරු වෙනුවට ඔහුගේ මැවීම් වැඳ පුද ගෞරව කිරීම ඉතාමත් අනුවන ක්‍රියාවක් බව, එවැනි ක්‍රියාවන්හි යෙදී සිටින්නන්ට නොපෙනීම පුදුමයකි. අල්ලාහ් (දෙවියන්) ගේ මැවීම්වලට වැඳුම් පිදුම් කරන්නන් අල්ලාහ් (දෙවියන්) ඔහුගේ සෑම මැවිල්ලකම එකහවී ඇති බවත්, ඔහුගේ සමහර මැවිලි තුලින් ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබිඹුවන බවත් අදහති. එසේ හෙයින්, එම මැවීම්වලට වැඳුම් පිදුම් කිරීම තුලින් අල්ලාහ්ට (දෙවියන්) වැඳුම් පිදුම් කරනවා මෙන්යැයි ඔවුන් තර්ක කරති.

එනමුත් අල්ලාහ්ගේ අනාගත වක්තෘන් (නබිවරුන්) විසින් මිනිසා වෙත ගෙනඑනු ලැබූ පණිවිඩයෙහි සඳහන් වන්නේ මිනිසා අල්ලාහ්ට පමණක් වැඳුම් පිදුම් කළයුතු බවය. එමෙන්ම ඔහුගේ මැවීම්වලට කෙළින් හෝ වටින් පිටින් අවනතවීමෙන් හෝ වැඳුම් පිදුම් කිරීමෙන් වැළකී සිටිය යුතු බවය.

අල්ලාහ් මෙසේ කියයි:

﴿وَلَقَدْ بَعَثْنَا فِي كُلِّ أُمَّةٍ رَسُولًا أَنِ اعْبُدُوا اللَّهَ
وَاجْتَنِبُوا الطَّاغُوتَ﴾

*සත්තික ලෙස අප, මුළු මිනිස් වර්ගයා වෙතම නබිවරයෙක් (යවා ඇත්තෙමු. ඔහු) ඔබ අල්ලාහ්ට වැඳුම් පිදුම් කරන්න: අසත්‍ය දෙවිවරුන්ගෙන් ඈත්වී සිටින්න (යනු උපදෙස් දෙනු සඳහා) යවා ඇත්තෙමු.*
(අල්කුර්ආන් 16:36)

පිළිමවලට වැඳ පුද සත්කාර කරන පිරිමියෙකුගෙන් හෝ ස්ත්‍රියෙකුගෙන්, 'මිනිසා විසින් අඹන ලද පිළිම ඉදිරියේ වැඳ වැටෙන්නේ ඇයිද?' යනුවෙන් විමසුවහොත් දෙදෙනාගෙන්ම එක වගේම පිළිතුරක් ලැබෙනවාට සැකයක් නොමැත. එම පිළිතුර නම් 'ඔවුන් ගලෙන් හෝ මැටියෙන් වූ එම පිළිමයන් නොවඳින බවත්, එතුලින් දෙවියන් වහන්සේ හට වඳින බවත් වේ. ඔවුන් පවසන්නේ එම ගල් හෝ මැටි පිළිමයන් දෙවියන් නොවන බවත්, දෙවියන් කරා සිත යොමු කරන්නට යම් ක්‍රමයක් ලෙස තබාගෙන සිටින බවත්ය. 'දෙවියන් වහන්සේ තමන් විසින් මවන ලද දේ තුල රැඳී සිටින්නේ' යන මතය අදහන්නෙක් සමහරවිට මෙම තර්කය ප්‍රගනු ඇත.

එනමුත්, ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්ති නිසිලෙස වටහාගෙන, ඒ සමඟ කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන යන යම් කෙනෙක් ඇත්නම් ඔහු මෙම තර්කය කිසිසේත් පිළිගන්නේ නැත. සෑම යුගයකම තමන්හට දේවත්වය ඇති බව ප්‍රකාශ කළවුන්, 'මිනිසා තුල දෙවියන් පැවත සිටින' බව වූ මෙම වැරදි මතය මුල්කරගෙනයි එසේ ප්‍රකාශ කළේ. ඔවුන්ගේ මෙම වැරදි මතය අනුව මිනිසා තුල දෙවියන් පැවත එන බව කියනත්, අනෙක් මිනිසුන්ට වඩා තමා සමඟ දෙවියන් එකඟ වී පැවත එන බවත් ඔවුන් තර්ක කරති. ඔවුන්ම දෙවියන් වශයෙන් හෝ දෙවියන් ඔවුන් තුල ඇති නිසා හෝ සෙස්සන් ඔවුනට අවනතවී වැඳුම් පිදුම් කළයුතු

යැයි කියා සිටිති. මෙම දේවත්වවාදීන් මරණයට පත්වූවායින් පසුව, ඔවුන්ගේ අනුගාමිකයින් මෙම මතය පිළිගත්තන් අතර ප්‍රමුඛස්ථානයක් ගෙන ජීවිතය භුක්ති විඳිති.

ඉස්ලාමයේ මූලික ඉගැන්වීම් සම්බන්ධව සාමාන්‍ය දැනීමක් ඇති කෙනෙක් පවා තමන් මෙන් වූ තවත් මිනිසෙකුට කුමන අවස්ථාවක වුවත් වැඳ වැටෙන්නට හෝ පුද පූජා කිරීමට හෝ කිසිසේත් එකඟ නොවේ.

මැවුම්කාරයාට වැඳීමටත්, මැවුනු සෙසු දේවලට වැඳුම් පිඳුම් කිරීම ප්‍රතික්ෂේප කිරීමටත් කෙරෙන පැහැදිලි ඇරයුම, දෙවියාගේ ආගමේ සාරාංශයවේ. එය පහත සඳහන් කුඩා වාක්‍යයෙන් මනාව පැහැදිලිවේ.

﴿لَآ إِلَٰهَ إِلَّا ٱللَّهُ﴾

## "ලාඉලාහ ඉල්ලල්ලාහ්"

නැමදීමට සුදුස්සෙක් "අල්ලාහ් හැර වෙන දෙවිකෙනෙක් නැත" යන්න මෙහි තේරුමය.

ඉහත සඳහන් මෙම වාක්‍යය යමෙක් සිතෙන් පිළිගෙන, ඒ අනුව ජීවත් වෙමියි යනුවෙන් අධිෂ්ඨාන කර, මුවින් කියන්නේ නම් ඔහු මුස්ලිමයෙකි; ඉස්ලාමය කරා ලඟාවූවෙකි. මෙය අවංකවම යමෙක් අදහන්නේ නම් ඔහු

නිසැකවම ස්වර්ගය ලබාගන්නේය. මුහම්මද් (සල්) තුමා මෙසේ පැවසූ බව අබූදර් (රලි)* තුමා වාර්තා කරයි. "කවුරුන් හෝ අල්ලාහ් හැර වෙන දෙවිකෙනෙක් නැත' යනු ප්‍රකාශකර ඒ සමඟම (විශ්වාසවන්තයෙකු ලෙස) මරණයට පත්වන්නේ නම් ඔහු ස්වර්ගයට ඇතුල් වෙයි." (බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි.)

එක දෙවියෙකු වශයෙන් අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනතවීම, ඔහුගේ අණට කීකරුවීමේ ආශිර්වාදයන් ලබා ගැනීම, බහුදේව වාදය හා බහුදේවවාදීන් ප්‍රතික්ෂේප කිරීම යනාදි කරුණු මෙම වාක්‍යයෙහි අඩංගු වේ.

## අසත්‍ය ආගම් ගෙන එන පණිවිඩය

ලෝකයේ නොයෙකුත් ආගම් ඇත; දර්ශනයන් හා ඇදහිලි ක්‍රම ඇත; සංවිධානයන් හා විවිධ මත දරණ කොටස් ඇත. මේවායේ නියැලී සිටින්නන් කියන්නේ ඔවුන් යහමග සිටින බවත් දෙවියන්ගේ සත්‍ය මාර්ගයෙහි සිටින බවත්ය. මේ කොටස් සෑමයක්ම සත්‍යයෙහි සිටින්නේද?නැතිනම් කිසියම් කොටසක් අසත්‍යයෙහි සිටින්නේද? මෙය කෙසේ දැනගනිමුද? මේ සඳහා වූ සාධක මොනවාද?

මෙම ප්‍රශ්ණවලට පිළිතුරු ලබාගත හැකි කිසි යම් ක්‍රමයක් ඇත. එනම්, මෙම ආගම්වලට නැතහොත් කොටස්වලට ඇතුලත් වී ඇති ලස්සන වචනවලින් අලංකාරවූ කරුණුවලින් එහා ඇත්තාවූ, ඒවායේ මූලික

* රලි - (රලියල්ලාහු අන්හු)

අරමුණ හා සත්‍යය කුමක්ද යනු බැලිය යුතුයි. කෙළින් හෝ වටින්පිටින් ඒ ඒ ආගමිකයින් කුමණ ක්‍රමයක වූ වැඳුම පිදුම් කරා මිනිසා කැඳවන්නේ දැයි බැලිය යුතුයි.

එවිට දෙවියන් ගැන මෙම අසත්‍ය ආගම් හා කොටස්වලට පොදුවූ මූලික අදහස් රැසක් ඇතිබව ඔබ දැනගන්නවා ඇත. ඒ අදහස් නම්, 'සෑම මිනිසෙකුම දෙවි කෙනෙක්ය', 'සමහර විශේෂ මිනිසුන් දෙවියන් වන්නේය': 'ස්වභාවය දේවත්වය ඇත්තකි': නැතිනම්, 'දෙවියන් මිනිසාගේ කල්පනා ශක්තියෙන් මවාගත්තෙකි' යනු ඒවා වේ.

අසත්‍ය ආගම් කියා සිටින්නේ දෙවියන් නැමදිය යුත්තේ ඔහුගේ මැවීම්වල හැඩහුරුකම් අනුව බවය. මෙම චේතනාව ලත් එම අසත්‍ය ආගම් මිනිසා තම ආගම් කරා කැඳවන්නේ මැවීම් හෝ ඒවායේ කිසියම් කොටස් දේවත්වය දරණ බව කීමෙන් ය.

උදහරණයක් වශයෙන් ජේසුස් තුමා ගැන කිව හැකිය. එතුමා තමන්ගේ අනුගාමිකයින්ට අණකළේ අල්ලාහ්ට පමණක් වන්දනය කළයුතු බවය. නමුත්, එතුමාගේ අනුගාමිකයින් ලෙස පෙනී සිටින්නන් අද යේසුස් තුමා දෙවියා බව කියා, එතුමා නැමදීමට මිනිසුන් කැඳවයි.

බුදුන් වහන්සේ සංශෝධකයෙකි. එතුමා ඉන්දිය ආගමට මානව හිතවාදී ප්‍රතිපත්ති රැසක් හඳුන්වා දුන්නේය.එතුමා තමන් දෙවියෙකු බව කිසිවිටෙක කියා සිටියේ නැත. එමෙන්ම තමන්ට වැඳුම් පිදුම් කළ යුතු බවත් එතුමා නොපැවසුහ. එනමුත්, අද ඉන්දියාවෙන් පිටත සිටින බොහෝ බෞද්ධයන් බුදුන් වහන්සේ දෙවියන් මෙන් සලකා,එතුමාගේ නමින් පිළිම අඹා, ඒවාට වැඳ පුද සත්කාර කරති.

වැඳුම් පිදුම් කිරීමේ අරමුණ නිසිලෙස හඳුනා ගැනීමේ චේතනාව තුලින් අසත්‍ය ආගම් දෙස නෙත් යොමුකරන්නේ නම්, ඒවායේ අසත්‍යතාවය හොඳහැටි මනාව පැහැදිලිව පෙනෙන්නේය. එමෙන්ම ඒ ආගම්හි ස්වාභාවික ආරම්භය කෙසේ විකෘති වීදැයි දැනගැනීමට ද හැක.

අල්ලාහ් මෙසේ පවසයි:

﴿مَا تَعْبُدُونَ مِن دُونِهِۦٓ إِلَّآ أَسْمَآءً سَمَّيْتُمُوهَآ أَنتُمْ
وَءَابَآؤُكُم مَّآ أَنزَلَ ٱللَّهُ بِهَا مِن سُلْطَـٰنٍ إِنِ ٱلْحُكْمُ إِلَّا لِلَّهِ
أَمَرَ أَلَّا تَعْبُدُوٓا۟ إِلَّآ إِيَّاهُ ذَٰلِكَ ٱلدِّينُ ٱلْقَيِّمُ وَلَـٰكِنَّ أَكْثَرَ
ٱلنَّاسِ لَا يَعْلَمُونَ﴾

"ඔහු (අල්ලාහ්) හැර ඔබ වැඳුම් පිදුම් කරන සෑමයක්ම ඔබ හා ඔබගේ මුතුන් මිත්තන් විසින් තබාගත් නම්හැර වෙන කිසිවක් නැත. ඒවාහට අල්ලාහ් කිසිම බලයක් දී නැත. අල්ලාහ්ට හැර (අන් කිසිවෙකුට) බලයක් නැත. ඔහු හැර (අන් කිසිවෙකුට) ඔබ වැඳුම් පිදුම් නොකළ යුතු බව (අල්ලාහ්) ඔහු (ඔබට) නදින්ම අණකර ඇත. සත්‍ය වූ ආගම ද මෙයයි. නමුත්, මිනිසුන්ගෙන් වැඩිදෙනෙක් මෙය නොදනී."

(අල්කුර්ආනය 12:40)

"ආගම් සියල්ල යහපත් දේ කියාදෙයි: උගන්වයි, එමනිසා එක ආගමක් පමණක් ඇදහිය යුතුයි යනුවෙන් පවසන්නේ ඇයි?" යනුවෙන් කවරෙකු හෝ තර්කානුකූලව වාද කළ හැක. මෙයට විසඳුම නම්, සෑම ආගමක්ම මැවීම්වලට වැඳුම් පිදුම් කිරීමේ පාපය උගන්වයි. මිනිසා කරන ඉතාමත් බලවත් පාපයක් වේනම්, එය මැවීම් වලට වැඳුම් පිදුම් කිරීමය. එසේ වැඳුම් පිදුම් කිරීම මිනිසා මැවීමේ අරමුණට ඉඳුරාම විරුද්ධ කාර්‍යයකි. මිනිසා මවා ඇත්තේ අල්ලාහ්ට පමණක් අවනත වීමටය; කීකරු වීමටය; වැඳුම් පිදුම් කිරීමටය. අල්ලාහ් ඉතාමත් පැහැදිලිව තම ශුද්ධ ග්‍රන්ථයේ මෙසේ කියයි.

﴿وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنسَ إِلَّا لِيَعْبُدُونِ﴾

"තවද, ජින් (වර්ගයා) හා මිනිස් (වර්ගයා) මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනත වී, මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවූයේ නැත".

(අල්කුර්ආන් 51:56)

පිළිමවලට වැඳුම් පිදුම් කිරීමට තුඩුදෙන, මැවීම්වලට වන්දනය කිරීම වනාහි අල්ලාහ්ගේ සමාව නොලැබිය හැකි මහා පාප ක්‍රියාවකි. මෙම පාප ක්‍රියාවේ යෙදෙන්නා ඒ තත්වය ඇත්තෙකුවම මරණයට පත්වේ නම්, ඔහුගේ මරණින් පසු වූ ජීවිතය කණගාටුදායක විය හැක. මෙය සාමාන්‍ය අදහසක් නොවේ. සර්වබලධාරී අල්ලාහ් තම ග්‍රන්ථයේ මේ ගැන විශේෂයෙන් පවසා ඇත.

﴿إِنَّ ٱللَّهَ لَا يَغْفِرُ أَن يُشْرَكَ بِهِۦ وَيَغْفِرُ مَا دُونَ ذَٰلِكَ لِمَن يَشَآءُ﴾

***"අල්ලාහ් තමන් හා හවුල්කරුවන් ඇති කිරීමට (කිසිසේත් ) සමාව නොදෙන්නේය. නමුත් ඔහු මේ නොවන (පාප) ක්‍රියාවන් සඳහා තමන් කැමති අයට සමාව දෙයි."***

(අල්කුර්ආන් 4:48,116)

## ඉස්ලාමයේ සාර්විකතාවය

අසත්‍ය ආගම් ඇදහීමෙන් මිනිසා නොමඟ යනනිසා, අල්ලාහ්ගේ සත්‍ය ආගම එනම් ඉස්ලාමය මුළු ලෝවැස්සන්ම අවබෝධ කරගැනීමත්, ඉනික්බිතිව එය තමන් සතු ආගමක් ලෙස පිළිපැදීමත් ඉතා වැදගත්ය. ඉස්ලාමය යම් සමාජයකට, රටකට , ස්ථානයකට හෝ කාලයකට පමණක් සීමා වූ ආගමක් නොවේ. මෙය අදහන්නෙක් ස්වර්ගය ලබාගැනීම සඳහා ඥානස්නානය කිරීමක් හෝ තමන්ගේ ගැලවීම සඳහා යම් පුද්ගයෙකුගේ උදව් උපකාර මත රැඳී සිටිය යුතුය යනු අදහසක් හෝ නැත. ඉස්ලාමයේ සාර්විකතාවය රඳා පවතින්නේ එහි වූ මූලික ප්‍රතිපත්තිය වූ අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනත විය යුතුය යන්නෙහිය.

අල්ලාහ්ගේ ඒකත්වය, ඔහුගේ මැවීම් හා ඔහු අතර ඇති වෙනස්කම් යනාදිය මිනිසා කවද හෝ දැනගෙන, ඔහුට සම්පූර්ණයෙන්ම අවනත වන්නේ නම් ඔහු කය හා ආත්මය දෙකෙන්ම මුස්ලිමෙක් වෙයි. ස්වර්ගය ලැබීමටද ඔහු සුදුස්සෙක් වෙයි. ඉතාමත් දුර බැහැර ප්‍රදේශයක අප්‍රසිද්ධව ජීවත්වන්නෙක් වුවත් ඕනෑම වේලාවක අල්ලාහ්ගේ මැවීම්වලට පුදපූජා කිරීමෙන් හෝ වැඳ වැටීමෙන් වැළකී අල්ලාහ්ට පමණක් අවනත වීමෙන් ඔහු මුස්ලිම් බැතිමතෙක් වේ.

තවත් වැදගත් කරුණක් නම් අල්ලාහ්ට අවනතවීම රඳාපවතින්නේ කෙනෙකුගේ හොඳ නරක දෙකෙන් එකක් තෝරා ගැනීමෙහි හා වගකීම්භාවයෙහිය. ඉස්ලාමයේ ගෙන දක්වා ඇති කරුණු අනුව නරකින් ඈත් වී හොඳ දේ තෝරා ගන්නා අල්ලාහ්ට අවනතවන්නෙකි.

මිනිසාගේ තේරීම්වලට ඔහුම වගකිවයුත්තා වේ. එම නිසා හැකිතරම් යහපත් ක්‍රියාවන්හි නියැලි සිටීමටත් අයහපතින් ඈත්වී සිටීමටත් වෑයම් කළ යුතුය. යහපත් ක්‍රියාව නම් අල්ලාහ්ට අවනත වී ඔහුට පමණක් වන්දනය කිරීමය. අයහපත් නින්දිත ක්‍රියාව නම් අල්ලාහ්ගේ මැවීම්වලට වැඳීම හෝ අල්ලාහ්ටත් ඔහුගේ මැවීම්වලටත් වැඳීමය.

කුර්ආනයේ මේ බව සඳහන් වෙයි.

﴿ إِنَّ ٱلَّذِينَ ءَامَنُوا۟ وَٱلَّذِينَ هَادُوا۟ وَٱلنَّصَـٰرَىٰ وَٱلصَّـٰبِـِٔينَ مَنْ ءَامَنَ بِٱللَّهِ وَٱلْيَوْمِ ٱلْـَٔاخِرِ وَعَمِلَ صَـٰلِحًا فَلَهُمْ أَجْرُهُمْ عِندَ رَبِّهِمْ وَلَا خَوْفٌ عَلَيْهِمْ وَلَا هُمْ يَحْزَنُونَ ﴾

"ඊමාන්ධාරී න් (විස්වාසවන්තයන්) යුදෙව්ව-රුන්, ක්‍රිස්තියානින් හෝ සාබීර්න්වරුන් අතුරෙන් කවරෙක් හෝ අල්ලාහ් සහ කියාමත් දිනය (අවසාන දිනය) විස්වාසකරමින් යහපත් ක්‍රියා කරයි ද ඔවුනු ඔවුන්ගේ ස්වාමීන් වෙතින් තමන්ට හිමි ත්‍යාගය ලබාගනු ඇත. ඔනු වෙත බිය, ශෝකය හෝ දුක් කම්කටොළු නොපැමිණෙනු ඇත."

(අල්කුර්ආන් 2:62)

﴿ وَلَوْ أَنَّهُمْ أَقَامُوا التَّوْرَاةَ وَالْإِنجِيلَ وَمَا أُنزِلَ إِلَيْهِم مِّن رَّبِّهِمْ
لَأَكَلُوا مِن فَوْقِهِمْ وَمِن تَحْتِ أَرْجُلِهِم ۚ مِّنْهُمْ أُمَّةٌ مُّقْتَصِدَةٌ ۖ
وَكَثِيرٌ مِّنْهُمْ سَاءَ مَا يَعْمَلُونَ ﴾

තවද ඔවුන් තව්රාත්, ඉන්ජිල් හා දෙවියන් විසින් අනාවරණය කල වූ සියල්ලක්ම පිළිගෙන ස්ථිරව සිටියේ නම් ඔවුනට සෑම පැත්තකින්ම සතුට භුක්ති විඳීමට ලැබෙන්නට ඇත. ඔවුන්ගෙන් සමහරෙක් පමණක් සත්‍ය මාර්ගයේ වූ සමාජයක් ලෙස සිටියවුන් වන්නේ නමුත් ඔවුන්ගෙන් වැඩි දෙනෙක් වැරදි ක්‍රියාවන්හි යෙදෙන්නෝ වෙති."

(අල්කුර්ආන් 5:66)

## අල්ලාහ් හඳුනාගැනීම

මෙහි නැගෙන තවත් ප්‍රශ්ණයක් ඇත. එනම් නොයෙකුත් සමාජීය, සංස්කෘතික පරිසරයන්හි ජීවත්වන

සෑම මිනිසෙක්ම අල්ලාහ් කෙරේ විශ්වාසය තැබිය යුතුය යන්න කෙසේ බලාපොරොත්තු වෙමුද? යනු එම ප්‍රශ්ණය වේ. අල්ලාහ්ට අවනතවී වැඳුම් පිදුම් කිරීමේ වගකීම මිනිසුන් වෙත පවරාතිබේ නම් ඒ සඳහා අල්ලාහ් ගැන දැනගැනීමේ මගක් තිබීම අවශ්‍ය නේද?

අල්ලාහ් එවැනි දැනීමක් ලබාගැනීමෙහිලා මිනිසා අනාථයෙක් බවට පත් කළේ නැත. මුළු මිනිස් වර්ගයාම අල්ලාහ් හඳුනාගැනීමේ ශක්තිය ස්වාභාවිකව මිනිසාගේම කොටසක්වන ආත්මයෙහි එකඟවී ඇත. අවසාන පොතවන අල්කුර්ආනයද මෙය පවසයි.

කුර්ආනයේ අල් අඃරාෆ් සූරාවේ 172, 173 ශුද්ධ වාක්‍යයන්හි, ආදම් (අලෙයි) නබිතුමා මැවූ විට, එතුමාගේ අනාගත පැවත එන්නන් එක්රැස්කොට අල්ලාහ් මෙසේ විමසූ බව කියැවේ.

"මම ඔබ (සැවොම) ගේ දෙවියන් නේද?" එවිට ඔවුන් "එසේමය. (ඔබ අපේ දෙවියන් බව) අපි සාක්ෂි දරමු." කියා සිටියෝය. මේ අන්දමේ පොරොන්දුවක් ආරම්භයේදීම අල්ලාහ් විසින් ඔවුන් ගෙන් ලබාගෙන ඇත.

ඉතික්බිතිව, "තමන්මය ලොව නිර්මාතෘවරයා: තමන්ට පමණය වැඳුම් පිදුම් කළ යුත්තේ" යනුවෙන් පොරොන්දුවක් ගත්තේ ඇයිදැයි අල්ලාහ් මෙසේ කියයි.

සමහර විට ඔබ (මිනිස් වර්ගයා) මරණින් පසු නැවත නැගිට වූවිට, 'ඇත්තෙන්ම අපි මේ ගැන කිසිවක් නොදනිමු' කියන්න පුළුවන් හෙයින් ය. ඒ කියන්නේ 'අල්ලාහ් අපගේ දෙවියන් බව අපි නොදනිමු; ඔහුට පමණක් නැමදිය යුතු බව අපිට කිසිවෙක් කීවේ නැත' යනු තර්ක කරන්න පුළුවන් නිසාය, ඉහත සඳහන් පොරොන්දුව ගනු ලැබුවේ.

තවත් අල්ලාහ් මෙසේ විස්තර කරයි:

'ඔබ කියන්න පුළුවනි, 'නිසැකවම අපගේ මුතුන් මිත්තන් ය (අල්ලාහ්ට) කොටස්කරුවන් ඇති කළේ. අපි ඔවුන්ගෙන් පැවත එන්නෝ වෙමු. (අපගේ මුතුන් මිත්තන්) කළ වැරදි සඳහා අපව විනාශ කරන්නේද?'

අල්ලාහ් මෙසේ විස්තර කිරීමෙන් පෙනීයන්නේ උපත ලබන සෑම දරුවෙක්ම අල්ලාහ් ගැනවූ ස්වාභාවික විශ්වාසය ඇතිව ඉපදෙන බවය. එමෙන්ම, අල්ලාහ්ට පමණක් නැමදීමේ ආශාවක්ද ස්වභාවයෙන්ම ඔහුතුල පැවතෙන බව නිසැකය. එයට ආරාබි භාෂාවෙන් 'ෆිත්රාහ්' යනු කියනු ලැබේ.

එම දරුවා තනියම තබා අපි ඉවත්වී සිටින්නේ නම්, ඔහුගේ වැටහීම අනුව අල්ලාහ්ට වන්දනය කරයි. නමුත්, ඔවුන් වෙනස්වන්නේ ඔවුන්ගේ පරිසරයේ පෙනෙන

නොපෙනෙන දේ අනුවය. අල්ලාහ් විසින් පවසනු ලැබූ බව මුහම්මද් (සල්) තුමා මෙසේ සඳහන් කරයි: "මම මගේ දසයන් සත්‍ය ආගමෙහි මැවූයෙමි: නමුත් දුෂ්ඨයන් ඔවුන් නොමග යැවීය." (මුහම්මද්) (සල්) නබිතුමා මෙසේද කීසේක:

"සෑම දරුවෙක්ම "පිත්රාහ්" නමැති තත්වයේ උපත ලබයි. ඉනික්බිති (ඔවුන්ගේ) දෙමාපියෝ ඔහුව යුදෙව්වෙක්, ක්‍රිස්තියානියෙක් හෝ සොරෝස්තරයෙක් කරන්නේය." (බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

අල්ලාහ් විසින් ඇතිකරන ලද ස්වාභාවික වූ බාහිර නීතීන් අනුව දරුවා තම දෙවියන්ට අවනත වන්නාසේම, ඔහුගේ ආත්මයද ස්වාභාවිකවම තමාගේ දෙවියන්ට අවනත වන්නේය. මෙය ස්වාභාවිකවම කෙරෙන දෙයකි. නමුත්, ඔහුගේ දෙමාපියෝ ඔවුන්ගේ අඩිපාරේ, ඇදහිලි ක්‍රම අනුව ගෙනයෑමට ප්‍රයත්න දරති. එවිට, එයට විරුද්ධවීමට තරම් ශක්තියක් එම දරුවාගේ ආරම්භ කාලයේ නොමැතිකම නිසා තම දෙමාපියන්ගේ අඩිපාරේ ගමන් කරන්නට හැකිය. එම අවධියේ ඒ දරුවා පිළිපදින ආගම නම් යම් යම් සිරිත්විරිත් වලින් යුත්තකි. මේ ගැන ඔහු අල්ලාහ්ට වගකිවයුත්තෙක් නොවන්නාසේම, ඔහුට (දරුවාට) දඬුවම් ද නොපමුණුවනුවයි.

මෙනමුදු, මිනිසාගේ කුඩා අවදියේ සිට මරණය දක්වා වූ සම්පූර්ණ කාලය තුලම සත්‍ය දෙවිකෙනෙක් (අල්ලාහ්) සිටින බව කියන සාක්ෂි ලොව අස්සක් මුල්ලක්

නොහැර සෑම තැනකම පෙනෙන්නට ඇත. ඔහුගේ ආත්මයද එයට සාක්ෂි දරන්නේය.

එනිසා, මිනිස් වර්ගයා අවංකව පිතාමතා ක්‍රියා කරන්නේ නම් අසත්‍ය දෙවිවරුන් සම්පූර්ණයෙන් හෙළා දකින අතර සත්‍ය දෙවියන් වූ අල්ලාහ් නොපසුබටව පිළිගනී. ඒ සඳහාවූ මාර්ගය ඔවුනට විවෘතව ඇත. නමුත් සෑමවිටම, නිරන්තරයෙන්ම ඔවුන් අල්ලාහ්ගේ පැවැත්ම කියාපාන නිදසුන් නොතකා ඔහුගේ මැවීම්වලට ප්‍රමුඛ ස්ථානයක් දී වැඳුම් පිදුම් කරන්නේ නම්,එයින් වන්නාවූ විපාකවලින් බේරීම ඉතාමත් දුෂ්කර වන්නේය.

එක් උදාහරණයක්:

දකුණු ඇමෙරිකාවේ, බ්‍රසීලයේ ඇති ඇමසෝන් මහා වනාන්තරයේ ගිණිකොන දෙසින් පිහිටි ස්ථානයක ජීවත්වන පුරාණ ගෝත්‍රිකයින්, ඔවුන් වැඳුම් පිදුම් කරන ප්‍රධාන පිළිමය වූ 'ස්කවච්' (Skwatch) පිළිමය තැබීම සඳහා කුඩා ගොඩනැගිල්ලක් තැනූහ. එම පිළිමය වනාහි ලොව ඇති සියල්ල මැවූ ශ්‍රේෂ්ඨතම දෙවියන් නියෝජනය කරන්නක් බව එම ගෝත්‍රිකයින්ගේ විශ්වාසය වේ. පසු දිනෙක එක් තරුණයෙක් එම පිළිමයට තමාගේ ගෞරවය පිරිනමා පුදපූජා කිරීමට පැමිණියේය. ඔහු තමාගේ මැවුම්කාරයා හා ආරක්ෂකයා ලෙස තදබල විශ්වාසයක් ඇතිව එම පිළිමය පාමුල වැඳවැටී සිටින කල්හි වයස්ගතවූ මැක්කන් වසාගත් කුෂ්ඨ රෝගීබල්ලෙක් එම ගොඩනැගිල්ලට ඇතුළු විය. එම තරුණයා තම හිස ඔසවනවාත් සමගම ඔහු දුටුවේ බල්ලා පිටුපස කකුලක්

ඔසවා එම පිළිමයේ තවත් පැත්තක මුත්‍රා කිරීමය. මෙම කැත ක්‍රියාව දුටු විගස ඔහු කෝපයට පත්වී බල්ලා එළවා දැම්මේය. නමුත් ඔහුගේ කෝපය ටිකින් ටික අඩුවී සාමාන්‍ය තත්වයකට පැමිණුනුවිට ඔහු කල්පනා කරන්නට විය. "එම බල්ලා කළ කැත ක්‍රියාව වළක්වාලීමට තරම් ශක්තියක් නොමැති, අහිංසක මෙම පිළිමය කෙසේ මගේ දෙවියන් වේද? විශ්වයේ අධිපති වේද? යනු ඔහුගේ සිත අවුල් විය. දැන් ඔහුට වැටහුනේය. දෙවියන් (අල්ලාහ්) වෙන කොහේදෝ සිටිනු ඇත. මෙය ගලෙන් තැනුනු පිළිමයක් පමණි.

ඔහු දැන් දෙවිදිහකින් ක්‍රියාකරන්න පුළුවන. එකක්: ඔහු නියම දෙවියන් (අල්ලාහ්) ගැන සොයාබලා ඔහු වෙත සම්පූර්ණ විශ්වාසය තබා අවනතවීම, අනෙක: තමාගේ සිතට විරුද්ධව හා අවංකභාවයෙන් තොරව ඔහු තමාගේ ගෝත්‍රිකයින්ගේ අසත්‍ය විශ්වාසය අනුව ගමන් කිරීම. ඇත්තෙන්ම, ඔහු එම ගෙඩනැගිල්ල තුල දුටුවේ අල්ලාහ් විසින් ඔහුට දෙනු ලැබූ විශේෂ සංඥාවකි. මෙම සංඥාවෙන් ඔහුගේ නැමදීම වැරදි බව පෙන්වා දී ඇත.

මෙහි කී පරිදි, සෑම සමාජයකටම, ගෝත්‍රයකටම, ප්‍රදේශයකටම නබිවරුන් එවා ඇත. එම උතුම් අනාගත වක්තෘවරු අල්ලාහ් කෙරෙහි මිනිසා තුල පවත්නා ස්වාභාවික විශ්වාසය වැඩි දියුණු කර ගැනීමට අනුබල දුන්නා පමණක් නොව, මිනිසා තුල රැඳී පවත්නා අල්ලාහ්ට පමණක් නැමදීමේ කැමැත්තද ඉටු වීමට අල්ලාහ් විසින් අනාවරණය කරන ලද උපදේශයන් ද

ගෙන දැක්වූහ. කෙසේ වෙතත්, බොහෝ නබිවරුන්ගේ ඉගැන්වීම් විකෘති කරන ලදුව, හොඳ නරක දේ පෙන්නුම් කරන කොටස් පමණක් ඉතිරිකර ඇත.

තව්රාත්හි දසපනත,ඒවා නහවුරු කරන බයිබලයේ නව ගිවිසුම, නොයෙක් සමාජයන් හි, මිනිස් ඝාතනය, සොරකම් කිරීම, කාමය වරදවා හැසිරීම යන පාප ක්‍රියාවන්ට පවතින නීති පද්ධතිය යන කරුණු විකෘත වූ ඉගැන්වීම් සඳහා උදහරණ වේ.

ඉස්ලාමයේ විකෘති කිරීමක් නැත. එය අල්ලාහ් විසින් දෙනුලැබූ ඒ ආකාරයෙන්ම අදත් පවතී. මෙවැනි හේතූන් නිසා අල්ලාහ් කෙරේ සම්පූර්ණ වූ විශ්වාසයක් තැබීම, ඔහුට මුළුමනින්ම අවනතවීම, ඔහුගේ ආගම වන ඉස්ලාමය පිළිගෙන ඒ අනුව පිවත්වීම යනාදිය ගැන මිනිසා අල්ලාහ්ට වගකිව යුත්තේය.

විශ්වයාධිපති, අල්ලාහ් ඉතාමත් කාරුණිකය. ඔහුගේ දයාව, අනුකම්පාව හා ආශිර්වාදය පතමු. ඔහු විසින් පෙන්වනු ලැබූ නිවැරදි මාර්ගයේ සදකල් ගමන් කිරීමට උදව්වන මෙන් ප්‍රාර්ථනාකරමු. තවද, ප්‍රශංසාව හා කෘතඥතාවය ඔහුටම හිමිය. සමාදනය හා ආශිර්වාදය මුහම්මද් (සල්) නබිතුමාණන්ටත් එතුමාගෙන් පැවත එන්නන්, මිත්‍රයන් හා එතුමාගේ අඩිපාරේ ගමන් කරන අනුගාමිකයින්ටත් අත්වේවායි පතමු.

# المكتب التعاوني للدعوة والإرشاد
# وتوعية الجاليات في منطقة البطحاء

تحت إشراف

وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد



ص.ب: ٢٠٨٢٤ الرياض ١١٤٦٥

هاتف [ ٤٠٣٠٢٥١ / ٤٠٣٠١٤٢- ١ - ٠٠٩٦٦
٤٠٣٤٥١٧ / ٤٠٣١٥٨٧- ١ - ٠٠٩٦٦

فاكس: ٤٠٥٩٣٨٧ - ١ - ٠٠٩٦٦

هاتف وفاكس صالة المحاضرات بالبطحاء

٤٠٨٣٤٠٥- ١ - ٠٠٩٦٦



حقوق الطبع محفوظة للمكتب

لا يسمح بطبع أي جزء من هذا الكتاب إلا بعد موافقة خطية مسبقة من المكتب

## هذا الكتاب يتناول:

- شرحاً موجزاً للدين الإسلامي، وأنه الدين الصحيح الذي لا يقبل الله ديناً سواه.

- استعراض الأديان والمبادئ الأخرى وبيان بطلانها.

- حقيقة عيسى وأمه عليهما السلام.

- عالمية الدين الإسلامي والحكمة في خلق الثقلين.

# الدين الصحيح

باللغة السنهالية

تأليف

أبو امينة بلال فيلبس

ترجمة

شريف الدين محمد منصور

هذا الكتاب من إعداد وترجمة

المكتب التعاوني للدعوة والإرشاد بالبديعة

# الدين الصحيح

(باللغة السنهالية)

تأليف

أبوامينة . بلال فيليبس

ترجمة

شريف الدين محمد منصور

هذا الكتاب من إعداد وترجمة

المكتب التعاوني للدعوة والإرشاد بالبديعة

١ / ١٤٢٠هـ

المكتب التعاوني للدعوة والإرشاد - قسم الجاليات - بالبطحاء

٣٥